# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1278/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 06/08/2024<br>පැය 0550 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පිටකොටුව පොලිස් ස්ථානය.**

2024.08.05 වන දින උදෑසන කාලයේදී පිටකොටුව පොලිස් වසමේ කොළඹ 12 ප්‍රදේශයේදී පිටකොටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 32 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පිටකොටුව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.**

2024.08.05 වන දින උදෑසන කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ සාතම්මාවත්ත ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 890 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන ඔරුගොඩවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. වන අලියකු පහර දී පුද්ගලයකු මියයාම - පන්සියගම පොලිස් වසම.

2024.08.05 වන දින උදෑසන කාලයේ පන්සියගම පොලිස් වසමේ පොල්වත්ත යාය ප්‍රදේශයේදී වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට පන්සියගම පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 74 ක් වන පොල්වත්ත යාය, මකුල්පොත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තම නිවස අසල සිටියදී මෙම වන අලි ප්‍රහාරයට ලක්ව ඇති අතර පන්සියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 04. වන අලියකු පහර දී පුද්ගලයකු මියයාමක් - හම්බන්තොට පොලිස් වසම.

2024.08.05 වන දින සවස් කාලයේ හම්බන්තොට පොලිස් වසමේ තිස්ස හම්බන්තොට මාර්ගයේ කොහොලංකල ප්‍රදේශයේදී යතුරු පැදියකින් ගමන් කල පුද්ගලයකු මර්ගය හරහා මාරුවෙමින් සිටි වන අලියෙකුගේ ගැටීමෙන් පසු එම වන අලියා පහරදීම හේතුවෙන් බරපතල තුවාල ලබා හම්බන්තොට රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට හම්බන්තොට පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක් වන හම්බන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හම්බන්තොට රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.
හම්බන්තොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 05. නීති විරෝදී මත්පැන් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - බෙම්මුල්ල පොලිස් ස්ථානය.

2024.08.05 වන දින සවස් කාලයේ බෙම්මුල්ල පොලිස් වසමේ දොරණාගොඩ ප්‍රදේශයේ දී බෙම්මුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් ලීටර් 67 මිලි ලීටර් 500 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන දොරණාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බෙම්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06.** **නීති විරෝදී මත්පැන් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - බණ්ඩාරගම පොලිස් ස්ථානය.**

2024.08.05 වන දින සවස් කාලයේ බණ්ඩාරගම පොලිස් වසමේ ගෝනපොල ප්‍රදේශයේ දී බණ්ඩාරගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් ලීටර් 67 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන ගෝනපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බණ්ඩාරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර සූරියපුර.**

2024.08.05 වන දින රාත්‍රී කාලයේ දී සූරියපුර පොලිස් වසමේ සිංහ වැව ප්‍රදේශයේ දී සූරියපුර පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සූරියපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ සෝමපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සූරියපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**08.** **ආනයනය තහනම් කරනලද කෘෂිරසායනික ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස්ථානය**

2024.08.05 වන දින සවස් කාලයේ දිවුලපිටිය පොලිස් වසමේ දී දිවුලපිටිය පොලිස්ථානයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට ආනයනය තහනම් කරන ලද කෘෂිරසායනික ද්‍රව්‍ය ලීටර් 05 බැගින් වූ කෑන් 20ක්** කාර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 44, 50 ක් වූ නුවරඑළිය හා ගෝනවෙල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**